# සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කරමු



අතීතයේ සිට ගෘහණිය තම නිවසේ පරිහරණය සදහා ගෘහපිළි සකස් කිරිමේද සහ ඇදුම් මැසිමේ භාවිත කළ රෙදි වල ඉතිරි කොටස් යොදා ගනිමින් විවිධ ගෘහ උපාංග සකස් කර ගනී. ඉතුරු වන රෙදි වල විවිධ හැඩයන්ට කපා වර්ණ සංකලනය ද කර විවිධ නිර්මාණ කර ගත හැකිය.කුෂන් කවර ,බිත්ති සැරසිලි ,බදුන් පලස් ආදී නිර්මාණද මෙලෙස සකස් කර ගන්නා නිර්මාණ වලට උදාහරණ වේ .මේ ආකාරයට විවේකය ද ඵලදායි ලෙස ගත කිරීමට රෙදි කැබලි භාවිත කරමින් සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණය කර ගැනීම සිදු කරයි





# සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණය කිරීමේදී විශේෂ අවධානය යොමු කල යුතු කරුණු

- දරුවාගේ වයසට සහ පරිණතියට ගැලපෙන ලෙස සෙල්ලම් බඩු නිර්මණය කිරීම
- කුඩා දරුවන් වඩාත් ප්‍රිය කරන සත්වයින්ගේ අනුරූ නිර්මාණය කිරීම උදා -: හාවා ,බල්ලා ,පූසා
- දරුවන් තුල ප්‍රසන්න මනෝභාවයක් ඇතිවන ආකාරයෙන් සෙල්ලම් සතුන් නිර්මාණය කිරීම
- දරුවන්ගේ ශරීර සෞඛ්‍යයට හිතකර රෙදි වර්ග තෝරා ගැනීම
- නිර්මාණයේ කොටස් ගැලවී නොයන සේ ශක්තිමත්ව මැසිම
- දරුවන්ට ආකර්ෂණය ඇතිවන සේ වර්ණ සංකලනය කර තිබීම
- නිර්මාණය සැහැල්ලු ලෙස සකස් කිරීම
- ත්‍රිමාණ හැඩය ලැබෙන ලෙස නිර්මාණය කිරීම



# සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණයේදී ආරක්ෂා විය යුතු ආකාරය

- මැසීමට පෙර දැත් වල පවිත්‍රතාවය තිබීම
- ඉදිකටු ,කතුරු වැනි තියුණු උපකරණ භාවිතයේ හා හුවමාරුවේදී ආරක්ෂාකාරී පියවර අනුගමනය කරන්න
- පතරමට අනුව රෙදි කැපීමේදී දික්නුල්,හරස් නූල් ,බලවාටිය යන ඒවා කෙරෙහි සැලකිලිමත් වීම
- නිර්මාණය සඳහා හොඳ නිමාවක් ලබ දීම
- නිර්මාණය සිදු කළ ස්ථානය පිරිසිදු කිරීම



# නිර්මාණය කිරීමේදී අවශ්‍ය වන ද්‍රව්‍ය හා උපකරණ හඳුනා ගනිමු

**ද්‍රව්‍ය-:** කුඩා දරුවන්ට හිතකර වන රෙදි වර්ගයන්

සුදුසු පිරවුම් ද්‍රව්‍ය උදා -: පැඩින් , පුළුන්
ඝන කඩදාසි ,කාබන් කඩදාසි ,තෙල් කඩදාසි
රිබන් වර්ග
වෙල්කෝ ටේප්
සතුන්ට අවශ්‍ය ඇස් ,කට, නාසය වැනි ද්‍රව්‍ය
පතරොම නිර්මාණයට අවශ්‍ය රූප සටහන්

**උපකරණ -:**

මහන මැෂිම
ඉදිකටු වර්ග ,කතුරු
මිනුම් පටි
දැති රෝදය, අල්පෙනෙත
දිදාලය
පැන්සල
අඩි රූල









# පෙන්ගුයින් නිර්මාණය කරමු

අවශ්‍ය වන ද්‍රව්‍ය-:

- වර්ණ දෙකකින් ෆෙල්ට් රෙදි (සුදු ,කළු )
- මැසිමට අවශ්‍ය ඉදිකටු
- සුදු හා කළු පැහැති කපු නූල්
- පිරවුම් මාධ්‍ය
- ඝන කඩදාසි
- බොත්තම් දෙකක් (ඇස් දෙක සඳහා )
- තෙල් කඩදාසි
- පැන්සල
- කතුරු




# පතොරම




උපදෙස් -:


- පතරොම් සදහා 0.5 cm ක මැහුම් වාසි තබා ගන්න
- තෙල් කඩදාසි යොදා ගනිමින් ඝන කඩදාසි මත පතොරම් කොටස් පිටපත් කරගන්න
- එසේ ඇද ගත් පතොරම් කොටස් කඩතොළු රහිතව කපා ගන්න.පතොරම් වල ඇති උපදෙස් පරිදි රෙදි වර්ණ අනුව කපා ගන්න
- පතොරම් වල ඇති ඉංග්‍රීසි අක්ෂර දක්වා ඇති කොටස් එකිනෙකට සම්බන්ධ කර ගනිමින් කද කොටස් හා බඩ යට කොටස් එකට තබා මසා ගන්න
- තරු ලකුණ යොදා ඇති කොටස පුළුන් පිරවීම සදහා ඉතුරු කරන්න
- හොට සදහා වර්ණ දෙකෙන් කපාගත් රෙදි කොටස් දෙක නොපිටෙන් මුට්ටු කර කැපුම් අද්දරවල් යොදා හොද පිට හරවා ගන්න. කකුල් කොටස් සදහා ද එලෙසම කරන්න
- තටු දෙක සදහා ද වර්ණ දෙකෙන් රෙදි කොටස් හතර කපා නොපිටෙන් බොරුනුල් ඇද ස්ථිර මැහුමක් යොදාගන්න.වටේට කැපුම් යොදා නොමැසූ කොටසින් හොදපිට හරවා ගන්න
- මසාගන්නා ලද පෙන්ගුයින්ගේ කඳ,හොට සහ කකුල් යන කොටස් හොදින් ලිහිල් කර පිරවුම් ද්‍රව්‍ය වලින් පුරවාගන්න.
- එම කොටස් නිවැරදි ලෙස ඉංග්‍රීසි අක්ෂර අනුව මසා ගන්න
- ඇස් දෙක සදහා බොත්තම් දෙකක් ශක්තිමත් ලෙස මසා ගන්න
- අනවශ්‍ය නූල් කොටස් ඇත්නම් කපා ඉවත් කොට නිර්මාණයට හොඳ නිමාවක් ලබා දෙන්න












B -
- A


C-
D-



- A
D -









# ස්තූතියි.